www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සිවිල් යුද්ධය උත්සන්න වීම මධ්‍යයේ ශ්‍රී ලංකා සාම සාකච්ඡා බිඳ වැටේ

## Sri Lankan peace talks collapse amid intensifying civil war

**කේ. රත්නායක විසිනි**

**2006 ඔක්තෝබර් 31**

පසු ගිය සති අන්තයේ ජිනීවාහි දී ශ්‍රී ලංකා ආන්ඩුව හා දෙමල ඊලම් විමුක්ති කොටි සංවිධානය (එල්ටීටීඊ) අතර පැවති සාකච්ඡා, තවත් සාකච්ඡා වටයක් කැඳවීම ඇතුලු කිසිදු කාරනාවක් පිලිබඳ එකගතාවක් නොමැතිව බිඳ වැටුනි. සාකච්ඡා බිඳ වැටීම, මේ වසර තුල දැනටමත් ජීවිත දහස් ගනනක් බිලි ගෙන ඇති යුද්ධය තව දුරටත් පුලුල් වීමකට නොවැලැක්විය හැකි ලෙස ම තුඩු දෙනු ඇත.

සාකච්ඡා අවසන් වී යන්තම් පැය කිහිපයක් ඇවෑමෙන් උතුරේ යාපන අර්ධද්වීපයේ මුහමලෙයි හා නගර්කෝවිල් ප්‍රදේශවල දී හමුදාව සහ එල්ටීටීඊය අතර දරුනු කාල තුවක්කු සටන් පැන නැගුනි. ජිනීවාහි සාකච්ඡා සිදු වෙමින් පවතිද්දී පවා යුද හමුදාපති සරත් ෆොන්සේකා ප්‍රාදේශීය මිලිටරි අන දෙන නිලධාරින් හමු වී “ආරක්ෂක තත්වය” ගැන සාකච්ඡා කරනු පිනිස යාපනයේ සංචාරයක යෙදුනේ ය.

ජනාධිපති මහින්ද රාජපක්ෂ “කොන්දේසි විරහිතව” ජිනීවා නුවරට නියෝජිත කන්ඩායමක් යැවීමට එකග වූයේ සිය ආන්ඩුවට සාකච්ඡාමය සාමයක් අවශ්‍ය ය යන වඩ වඩා පල්ල ගිය වංචාව පවත්වා ගෙන යාම සඳහා ම පමනි. ඔහු, ජුලි මස සිට මේ දක්වා, 2002 සටන් විරාමය උල්ලංඝනය කරමින්, ප්‍රහාරාත්මක මෙහෙයුම්වල යෙදීමට මිලිටරියට අන දී නැගෙනහිර මාවිල්ආරු හා සාම්පූර්හි ද යාපන අර්ධද්වීපයේ මුහමලෙයිහි ද එල්ටීටීඊයට අයත්ව තිබූ භූමි ප්‍රදේශ අල්ලා ගෙන ඇත.

එල්ටීටීඊය අතින් අල්ලා ගත් ප්‍රදේශ අතහැරීමක් අදහස් කෙරෙන 2002 සටන් විරාමය කරා ආපසු යාමේ අභිප්‍රායක් ආන්ඩුවට නැත. එහි ප්‍රතිඵලයක් ලෙස, ජිනීවාහි දී මොන යම් හෝ සීමිත එකගතාවක් සඳහා ආරම්භයේ පටන් ම පැවතියේ ඉතා මඳ බලාපොරොත්තුවකි.

සන්ඩේ ටයිම්ස් ආරක්ෂක ලියුම්කරු ඉක්බාල් අතාස් පසු ගිය සති අන්තයේ මෙසේ සටහන් කලේ ය “ගරිල්ලාවරුන්ගේ මිලිටරි ධාරිතාව දුර්වල වන තෙක් ආරක්ෂක හමුදා ප්‍රහාරාත්මක මෙහෙයුම් දිගට ම ගෙන යාම අවශ්‍ය කරන බලගතු කන්ඩායම් කොලඹ සිටිති.” අතාස්ට ශ්‍රී ලංකා මිලිටරි හා ඔත්තු සේවා සංස්ථාපිතය සමග සමීප සබඳතා පවතී.

දෙදින සාකච්ඡා සඳහා න්‍යාය පත්‍රයක් ගැන කිසිදු එකගතාවක් පැවතියේ නැත. නෝර්වේ ජාත්‍යන්තර සංවර්ධන අමාත්‍ය එරික් සොල්හෙයිම්, සාකච්ඡා අසාර්ථක වුව හොත් ආන්ඩුවට ආධාර මුදල් අහිමි වන අතර එල්ටීටීඊය තව දුරටත් ජාත්‍යන්තරව හුදකලා වනු ඇතැයි අනතුරු අගවමින්, දෙපාර්ශ්වය ම මත පීඩනය යෙදීමට උත්සාහ කලේ ය. එහෙත් එම තර්ජනවලින් පලක් නොවී ය.

දොරගුලු ලාගෙන පැවති සාකච්ඡාවල දී උනුසුම් වචන හුවමාරු වූ බව ප්‍රවෘත්ති වාර්තා පෙන්නුම් කරයි. ඩේලි මිරර් පත්‍රයට අනුව, එල්ටීටීඊය “අතීතය අමතක කිරීමට කැමති” බවත් සාම්පූර් හා සෙසු ප්‍රදේශ ආපසු භාර දීමේ ඉල්ලීම මතු නොකරන බවත් එල්ටීටීඊයේ ප්‍රධාන සාකච්ඡාකරු එස්.පී. තමිල්චෙල්වම් පැවසී ය. එල්ටීටීඊයේ ප්‍රධාන ඉල්ලීම වූයේ උතුරේ ප්‍රදේශ තුල කොටු වී සිටින ජනතාව වෙත ආහාර සහ සෙසු සැපයුම් ලගා වීමට ඉඩ ලැබෙන පරිදි, එල්ටීටීඊ ප්‍රදේශ හරහා යාපනයට දිවෙන ඒ-9 මහා මාර්ගය යලි විවෘත කිරීම යි.

කෙසේ වෙතත්, මුහුදු මාර්ගයෙන් භාන්ඩ යැවීමට පමනක් ඉඩ දීමට යෝජනා කරමින්, ආන්ඩුවේ නියෝජිත කන්ඩායම එම ඉල්ලීම ප්‍රතික්ෂේප කලේ ය. ප්‍රධාන සාකච්ඡාකරු නිමල් සිරිපාල ද සිල්වා ප්‍රකෝපකාරී ලෙස එල්ටීටීඊයෙන් ඉල්ලා සිටියේ ඔවුන්ගේ පාලනය යටතේ පවත්නා ප්‍රදේශ තුල ආන්ඩුවේ උසාවිවලට, පොලීසියට හා සියලු දේශපාලන පක්ෂවලට ක්‍රියාත්මක වීමට අවසර දීම මගින් උතුර හා නැගෙනහිර “සාමාන්‍යකරනය” කරන ලෙස යි. එවන් පියවරක් එල්ටීටීඊයේ මිලිටරි තත්වයට තව දුරටත් වල කැපීමටත් එල්ටීටීඊයේ භූමි ප්‍රදේශ තුල ආන්ඩුවේ හා මිලිටරියේ ප්‍රකෝපකරනයන්ට දොර විවෘත කිරීමටත් තුඩු දෙනු ඇත.

ඒ-9 මාර්ගය පිලිබඳ ප්‍රශ්නය මත අවසානයේ සාකච්ඡා බිඳ වැටුනි. මහා මාර්ගය "ආරක්ෂක හේතූ" මත දිගට ම වසා තැබෙන බව අවධාරනය කල, ද සිල්වා සිය ප්‍රදේශය හරහා ගමන් කරන වාහනවලින් කලින් දැවැන්ත බඳු අය කිරීම පිලිබඳව එල්ටීටීඊයට චෝදනා කලේ ය. මානුෂික සැපයුම් යාපනයට ලගා වීම පිනිස මාර්ගය අධීක්ෂනය කිරීමට නෝර්වේජියානු නායකත්වයෙන් යුත් ශ්‍රී ලංකා සටන් විරාම නිරීක්ෂන කමිටුව (එස්එල්එම්එම්) ඉදිරිපත් වීමට කල යෝජනාවක් ද ඔහු ප්‍රතික්ෂේප කලේ ය.

නව සාකච්ඡා වටයකට පෙර ඒ-9 මාර්ගය යලි විවෘත කල යුතු බවට සිය ප්‍රවෘත්ති නිවේදනය තුල එල්ටීටීඊය අවධාරනය කලේ ය. "ඒ-9 මහා මාර්ගය වසා දැමීම" හමුදා වාඩිලෑම යටතේ "යාපන අර්ධද්වීපයේ සිටින 600,000කට අධික ජනයාට විවෘත සිර ගෙයක් නිර්මානය කර ඇත" යැයි ප්‍රකාශ කල එය එම සම්බාධකය නව "බර්ලින් තාප්පයක්" ලෙස නම් කලේ ය.

සාකච්ඡා සමාප්ත කරමින් සොල්හෙයිම් මෙසේ ප්‍රකාශ කලේ යෑ: "දෙපාර්ශ්වය ම සටන් විරාම ගිවිසුමට ඇති සිය කැපවීම යලි අවධාරනය කොට කිසිදු මිලිටරි මෙහෙයුමක් දියත් නොකරන බවට පොරොන්දු වූහ." එහෙත් ආන්ඩුව හා මිලිටරිය, විවිධ "මානුෂික" හා "ආරක්ෂක" කඩතුරාවන් යටතේ එල්ටීටීඊ භූමි ප්‍රදේශ අල්ලා ගනිමින්, ගිවිසුම උල්ලංඝනය කිරීමේ සිය අභිප්‍රාය නැවත නැවතත් ප්‍රදර්ශනය කර ඇත.

ඒ-9 මහා මාර්ගය යලි විවෘත කිරීම ප්‍රතික්ෂේප කිරීමට ආන්ඩුවට පවත්නා ප්‍රධාන හේතුව වන්නේ, එය වසා තැබීම මගින් එල්ටීටීඊය මත දිගට ම පීඩනය යෙදීමේ හැකියාව හමුදාවට ලැබීම යි. එම මාර්ගය ඔස්සේ පවත්නා ප්‍රධාන මූලෝපායික ප්‍රදේශ යලි අල්ලා ගනු පිනිස මෙහෙයුමක් දියත් කිරීමට මිලිටරියට අවශ්‍යව ඇත. 2000 දී ප්‍රථම වතාවට හමුදාවට අහිමි වූ, යාපන අර්ධද්වීපයට ඇතුලු වන දොරටුව වන අලිමංකඩ ද එම ප්‍රදේශවලට ඇතුලත් ය.

අලිමංකඩට උතුරින් පිහිටි මුහමලෙයිහි එල්ටීටීඊ මධ්‍යස්ථානවලට එරෙහිව ඔක්තෝබර් 11 දා මිලිටරිය ප්‍රධාන මෙහෙයුමක් දියත් කල නමුත් එය පසු බස්වන ලදි. එල්ටීටීඊය සිය භූමි ප්‍රදේශ තුල මිය ගිය සොල්දාදුවන් 75කගේ සිරුරු භාර දීමෙන් පසුව, එම ප්‍රහාරය "ආරක්ෂක" මෙහෙයුමක් බවට කෙරුනු කියා පෑම පවයක් බව ඉක්මනින් ම එළිදරව් විය. සමස්තයක් වසයෙන්, එම දරුනු සටනින් සොල්දාදුවන් 130ක් මරුමුවට පත්ව 500කට වඩා තුවාල ලැබී ය.

හබරන නගරය අසල දී අඩු ගනනේ නාවික භටයන් 116ක් මරා දැමූ ඔක්තෝබර් 16 මරා ගෙන මැරෙන බෝම්බ ප්‍රහාරයෙන් සහ ඔක්තෝබර් 25 දා දකුනු පලාතේ ගාල්ල වරායේ නාවික කඳවුරට එල්ල කල ප්‍රහාරයකින් එල්ටීටීඊය ප්‍රතිචාර දැක්වී ය. සාකච්ඡා බිඳ වැටීමෙන් පසුව, එල්ටීටීඊය අනතුරු ඇඟවූයේ මිලිටරිය යාපන අර්ධද්වීපයේ තවත් ප්‍රහාරයක් සඳහා සූදානම් වන බව යි.

## කොලඹ දේශපාලනය

තම ආන්ඩුවේ ආක්‍රමනික මිලිටරි පිලිවෙත වසං කර ගැනීමට රාජපක්ෂ ප්‍රවේශම් වී ඇත්තේ හේතු දෙකක් නිසා ය. පලමුව. 1983 සිට මේ දක්වා ජීවිත දස දහස් ගනනක් බිලි ගෙන ඇති සිවිල් යුද්ධය කරා ආපසු යාමක් ජනගහනයේ අති මහත් බහුතරයකට අවශ්‍ය නැත. දෙවනුව. තමන්ගේ කොන්දේසි මත එල්ටීටීඊය සාකච්ඡා මේසයට තල්ලු කර ගනු වස් ප්‍රධාන ජාත්‍යන්තර බලවතුන්ගේ පිටුබලය දිගට ම තබා ගැනීමක් සහතික කර ගැනීමට ජනාධිපති ක්‍රියා කරයි.

පසු ගිය නොවැම්බරයේ ජනධිපතිවරනයෙන් රාජපක්ෂ යන්තම් ජය ගත්තේ සිංහල අන්තවාදී පක්ෂ දෙකක් වන ජනතා විමුක්ති පෙරමුනේ (ජවිපෙ) සහ ජාතික හෙල උරුමයේ පිටුබලය සහිතව ය. ඔහුගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රීලනිප) නිල සභාගයක් ගොඩ නගා ගනු වස් ජවිපෙ නායකයන් සමග දිග්ගැසුනු සාකච්ඡාවල නිරත විය. එහෙත් ආන්ඩුව 2002 සටන් විරාමය අහෝසි කිරීමටත් ජාත්‍යන්තර "සාම ක්‍රියාදාමයේ" නිල පහසුකම් සලසන්නාගේ සේවයෙන් නෝර්වේ රාජ්‍යය ඉවත් කිරීමටත් පියවර ගත යුතු යැයි ජවිපෙ අවධාරනය කිරීමෙන් පසුව සාකච්ඡා බිඳ වැටුනි.

ප්‍රථම වතාවට දිගු කාලීන ප්‍රතිවාදීන් අතර මහා සභාගයක් පිහිටුවමින්, පසු ගිය සතියේ දී, ශ්‍රීලනිපය විපාර්ශ්වික එක්සත් ජාතික පක්ෂය (එජාප) සමග ගිවිසුමක් අත්සන් කලේ ය. 2002 දී බලයේ සිටි එජාපය එල්ටීටීඊය සමග සටන් විරාම ගිවිසුම අත්සන් කොට යුද්ධය අවසන් කරනු පිනිස බලය බෙදා ගැනීමේ සාකච්ඡාමය එකගතාවක් ඇති කර ගැනීමට ප්‍රයත්න දැරී ය. එහෙත් ශ්‍රීලනිප, ජවිපෙ හා මිලිටරිය දිගින් දිගටම සාකච්ඡා කඩාකප්පල් කිරීමට ක්‍රියා කලේ ය. ශ්‍රීලනිප-එජාප සභාගය යුද්ධය අවසන් කිරීමේ "පොදු එකගතාවක්" ලෙස පෙන්නුම් කෙරෙන නමුත් එම ගිවිසුම මිලිටරියට සිය මෙහෙයුම් දිගටම ගෙන යනු වස් පූර්න අවසරය ලබා දී ඇත.

තමන් රට පාවා දෙන බවට ජවිපෙ කරන චෝදනාවන්ට මෙම පක්ෂ දෙක ම අතිශයින් ම සංවේදී ය. ජිනීවා සාකච්ඡා පැවති කාලය තුල දී, ජවිපෙ මොන යම් හෝ සාකච්ඡාවක් හෙලා දකිනු වස් "ජන හමුව" නමින් පුලුල් වැඩපිලිවෙලක් සංවිධානය කලේ ය. "කොටි ත්‍රස්තවාදීන්ට වාසි වන සාකච්ඡා මේසය කරා මාවත සකසන සහ කොටි ත්‍රස්තවාදය පරාජය කිරීමේ සීමිත යුද්ධය බාල කරන" පියවරක් ලෙස ජවිපෙ ශ්‍රීලනිප-එජාප සභාගය හෙලා දුටුවේ ය.

ජව්පෙ ඉල්ලා සිටින්නේ එල්ටීටීඊය විනාශ කිරීමේ පූර්න පරිමාන මෙහෙයුමකට නොඅඩු දෙයකි.

කොලඹ ආන්ඩුව සමග බලය බෙදා ගැනීමේ එකගතාවක් සඳහා මහ බලවතුන්ගේ පිටුබලය ලබා ගැනීමේ එල්ලයෙන් යුත් එල්ටීටීඊයේ දේශපාලන ඉදිරිදර්ශනය ජිනීවා සාකච්ඡා බිඳ වැටීම මගින් යලිදු වතාවක් එලිදරව් වී තිබේ. ජිනීවාහි දී එය කල ප්‍රධාන ආයාචනය වූයේ 2002 සටන් විරාමයට අනුව ක්‍රියා කරන ලෙස ශ්‍රී ලංකා ආන්ඩුවට බල කරන්නැයි සම-සභාපතිවරුන්ගෙන් හා "ජාත්‍යන්තර ප්‍රජාවෙන්" ඉල්ලා සිටීම යි. සම-සභාපතිවරු -- එක්සත් ජනපදය, යුරෝපා සංගමය. ජපානය සහ නෝර්වේ -- ශ්‍රී ලංකාවට ආධාර දෙන ජාත්‍යන්තර කන්ඩායමේත් ඊනියා සාම ක්‍රියාදාමයේත් සභාපතිත්වය දරයි.

කෙසේ වෙතත්, භූගෝලීය බලවතුන් ශ්‍රී ලංකාවේ සාමය ගැන උනන්දු වන්නේ, දකුනු ආසියාව තුල තමන්ගේ ම අවශ්‍යතා වැඩි දියුනු කර ගැනීමේ විධි ක්‍රමයක් ලෙස පමනි. විශේෂයෙන් ම එක්සත් ජනපදයේ අභිප්‍රාය වන්නේ ආයුධ අතහැර අවම දේශපාලනික ක්‍රියාකලාපයක් භාර ගන්නා ලෙස එල්ටීටීඊයට බල කිරීම යි. වොෂිංටනය කොලඹ ආන්ඩුවට මිලිටරි සහයෝගය ලබා දීමට ඉඩ ඇතැයි එක්සත් ජනපද නිලධාරින් අගවා ඇත. සාකච්ඡා ඇරඹීමට ආසන්නයේ දී එක්සත් ජනපද හා ශ්‍රී ලංකා මිලිටරි හමුදා ප්‍රථම වතාවට ඒකාබද්ධ මුහුදු-ගොඩ බිම් අභ්‍යාසයක් පැවැත්වීමට නියමිතව තිබූ අතර එය අවසන් මොහොතේ දී කල් දමන ලදි.

සම-සභාපතිවරු තමන් අපක්ෂපාතී හා මධ්‍යස්ථ ලෙස පෙනී සිටින නමුදු ශ්‍රී ලංකා මිලිටරියේ ප්‍රකෝපකාරී ක්‍රියාවන් සහ එල්ටීටීඊ භූමි ප්‍රදේශ තුලට කෙරුනු පැහැදිලි කඩාපැනීම් ගැන කිසිදු විවේචනයක් සිදු කොට නැත. එක්සත් ජනපදය සාම සාකච්ඡාවලට සහයෝගය දෙන අතරම එහෙත් "ත්‍රස්තවාදයට ප්‍රතිරෝධය දැක්වීමේ දී ශ්‍රී ලංකාවේ ආන්ඩුව හා ජනතාව සමග සිටින" බව, එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේ සහකාර ලේකම් රිචඩ් බවුචර්, ඔක්තෝබර් 19-20 දිනවල කොලඹට සිදු කල සංචාරයක් තුල දී කෙලින් ම ප්‍රකාශ කලේ ය.

රාජපක්ෂ ආන්ඩුව සමග, එක්සත් ජනපදය සහ සෙසු මහ බලවත්තු ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධය උත්සන්න වීම පිලිබඳ දේශපාලන වගකීම දරති.

© www.wsws.org